**කාත්තන්කුඩි නගර සභාව - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාත්තන්කුඩි නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.13,451,780ක් වැයකර සම්පූර්ණ කළ බහාලුම් කඩකාමර 12ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | බහාලුම් කඩකාමර සියල්ලෙහි වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට පියවර ගෙන ඇති බව. | සභාව සතු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | පළාත් සංවර්ධන සහාය වැඩසටහනින් ලැබිය යුතු රු. 199,422ක මූලධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූලධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට පියවර ගෙන ඇති බව. | ලැබිය යුතු මූලධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිවත් බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිවත් පවරා තිබූ නඩු 04ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට පියවර ගනු ලබන බව. | නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සටහන් මගින් හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.261,222,755ක් වටිනා ගිණුම් ශේෂ 07කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් හිමිකම් ඔප්පු ලබාගැනීමටත්, යන්ත්‍ර, මෝටර් රථ හා ගෘහ භාණ්ඩවලට අදාල ලේඛන ලබාගැනීමටත් විධිවිධාන සලසා ඇති බව. | ශේෂ සනාථ කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | සභාවේ සේවකයින්, කොන්ත්‍රාත්කරුවන් සහ රාජ්‍ය ආයතනවලට ලබාදුන් අත්තිකාරම් රු.10,106,886ක් හඳුනාගෙන නිරවුල් කිරීමට මාස 02ක සිට වර්ෂ 16ක් දක්වා කාලයක් පියවර ගෙන නොතිබුණි. | දීර්ඝ කාලයක සිට නිරවුල් නොකළ අත්තිකාරම් විස්තර කමිටුවක් ස්ථාපිත කර විමර්ශනය කිරීමෙන් නිරවුල් කිරීමට පියවර ගෙන ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි රු.1,110,219ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | දීර්ඝකාලීන තැන්පතු ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ආ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන සහ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ 2020 ජූලි 10 දිනැති අංක EP/01/CMA/Cabinet.Memo/007 දරන ලිපිය | වරිපනම් හා බදු අයකිරීම සඳහා නාගරික සීමාව තුළ පවතින නිශ්චල දේපළ වර්ෂ 05කට වරක් තක්සේරු කළයුතු වුවත්, 2014 වර්ෂයේ තක්සේරු කළ සම්පූර්ණ ඒකක ප්‍රමාණය වන 25,484ක් පදනම් කරමින් වරිපනම් බදු අයකර තිබුණි. | මෙම කරුණ පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධවී කටයුතු කරන බව. | නිශ්චල දේපළ වර්ෂ 05කට වරක් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,148,387ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,567,389 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 22,030,000 | 35,781,669 | 19,355,556 | 16,426,113 | 21,612,000 | 22,371,641 | 20,367,473 | 11,594,381 |
| කුලී | 10,089,000 | 10,461,725 | 10,081,350 | 380,375 | 12,420,000 | 7,495,627 | 7,287,527 | 208,100 |
| බලපත්‍ර ගාස්තු | 3,920,000 | 4,366,495 | 4,337,935 | 28,560 | 4,060,000 | 4,088,230 | 4,073,780 | 38,000 |
| වෙනත් ආදායම් | 96,553 | 41,092,693 | 40584,868 | 507,825 | 124,804,000 | 100,644,294 | 100,582,287 | 5,614,576 |
| එකතුව | 36,135,553 | 91,702,582 | 74,359,709 | 17,342,873 | 162,896,000 | 134,599,792 | 132,311,067 | 17,455,057 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා බදු රු.5,042,645ක් වූ අතර ඉන් රු.4,657,935ක් දේපළ 25,484කට අදාලව වර්ෂ 02 සිට 05ක් දක්වා කාල පරාසයට අයත් ශේෂයන් විය. | හිඟහිටි අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 14,805,656ක් විය. | අදාල මුද්දර ගාස්තු අයකර ගැනීමට නියමිත බව. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ (පරිච්ඡේදය 623) 3(1) වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදලේ II කොටස, 16(1) වගන්තිය ප්‍රකාරව, නියමිත මාසයට අදාල දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට ප්‍රථම එම අරමුදල්වලට ගෙවිය යුතු අතර අපොහොසත් වුවහොත් දඩගාස්තු සමග දායක මුදල් ගෙවිය යුතු බව සඳහන් වේ. එසේ වුවත්, සභාව විසින් 2021 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් එකතුව රු.9,388,517ක් නියමිත දිනයට ගෙවීම් කර නොතිබුණි. | සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් එම අරමුදලට ගෙවීමට වර්තමානයේ පියවර ගෙන ඇති බව. | සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් නියමිත කාල වකවානු තුළ ගෙවීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාවේ නීතිමය විෂයන් මෙහෙයවීමටත්, ඒ පිළිබඳ උපදෙස් ලබාගැනීමටත් අධිකරණයේ සභාව වෙනුවෙන් පෙනී සිටීමටත් වශයෙන් 2018 වර්ෂයේ සිට නීතිඥවරයෙකු අනුයුක්ත කර මාසිකව ඔහුට රු.20,000ක් බැගින් ගෙවීම් කර තිබුණි. එසේ වුවත්, 2022 වර්ෂයේ සභාව විසින් පවරා තිබූ නඩු 02ක් සඳහා සභාව වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් බාහිර නීතිඥවරයෙකුට රු.215,000ක් ගෙවා තිබුණි. | අදාල නඩු කටයුත්තේදී විෂය ක්ෂේත්‍රයේ පලපුරුදු නීතිඥයන් මාර්ගයෙන් කටයුතු කිරීමේදී පමණක් සභාවට වාසිසහගත තීන්දු ලබාගත හැකි බැවින් පිටස්තර නීතිඥවරයෙකු තෝරා ගැනීමට සිදුවී තිබුණු බව. | විධිමත් අනුමැතිය සහිතව පමණක් වියදම් සිදුකළ යුතුය. |
| (ඇ) | වර්ෂ 05ක කාලයක් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ රු.33,206,837ක් වූ වාහන 53ක් හා ට්‍රේලර් 17ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර මූල්‍ය ප්‍රකාශන සැකසීමට කටයුතු කර ඇති බව. | වාහන සහ ට්‍රේලර්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අළුත්වැඩියා තත්ත්වයේ පවතින වාහන 11ක් සහ ට්‍රේලර් 06ක් අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි වෙන්දේසි කිරීමට පසුගිය වර්ෂ 05ක කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේ පියවර ගනු ලබන බව. | වාහන අළුත්වැඩියා කිරිමට හෝ අපහරණය කිරීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරන වාහන 05ක අයිතිය පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | වාහනවල හිමිකාරිත්වය ලබාගැනීමට, වාහනවල විස්තර කොම්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | සභාව සතු වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 46ක් පැවැතීමෙන් පොදු ජනතාවට සපයනු ලබන සේවාවන් දුර්වල තත්ත්වයේ පැවැතුණි. | අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. |
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරීන් 03ක් සහ ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය එකතුව රු.46,792ක් වර්ෂ 05ක සිට අයකර නොතිබුණි. | හිඟහිටි සේවක ණය අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟහිටි සේවක ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. |